ජනපති යළි දිවයිනට

● කටුනායක - ටී.කේ.ජී. කපිල

විස්සත් ජාතීන්ගේ සංවිධානයේ මෙහෙය වීමෙන් ස්කොට්ලන්තයේ ග්ලාස්ගෝ නුවර පැවති ලෝක පරිසර සමුළුවට සහභාගි වීම සඳහා එරටට ගොස් සිටි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඇතුළු පිරිස ඊයේ (04දා) මෙරටට පැමිණියහ.

මෙම පිරිස එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි සිට එමිරේට්ස් ගුවන් සේවයේ ඊ.කේ.- 650 දරන ගුවන් යානයෙන් ඊයේ උදෑසන 08.30ට කටුනායක ගුවන්තොටුපළ වෙත පැමිණ තිබුණි.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම.

මොනරාගල දිසා අධිකරණයේදීය.

සෙලාන් බැන්ක් පීඑල්සී,
(පෙර සෙලාන් බැන්ක් ලිමිටඩ් ලෙස හැඳින් වූ)
සෙලාන් ටවර්ස්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

නඩු අංකය : 1411/MB
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 3,082,461/70
[illegible] අංකය : 12/2021

පැමිණිලිකරු.

එදිරිව

[illegible] විද්‍යා [illegible]
අංක 38/4, [illegible] පාර, මොණරාගල.

විත්තිකරු.

මොණරාගල දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2019ක් වූ මැයි මස 30වන දින ලබාදෙන ලද නඩු තීන්දුව අනුව, රුපියල් [illegible] (රු. 2,600,000/-) අදාළ [illegible] මුදලින් වර්ෂ 2016.04.28 දිනට ගෙවිය යුතු රුපියල් [illegible] (රු. 2,273,923/80) මුදලක් සහ එම මුදල මත වර්ෂ 2016.04.28 වන දින සිට [illegible] (19%) වාර්ෂික පොලී [illegible] ඇති 2016.08.25 [illegible] රුපියල් [illegible] (රු. 763,000/-) [illegible] වර්ෂ 2016.04.28 දිනට ගෙවිය යුතු රුපියල් [illegible] (රු. 808,537/90) මුදලක් සහ එම මුදල මත [illegible] ඇති 2016.08.25 දක්වා [illegible] (16%) ක වාර්ෂික පොලියක් [illegible] වර්ෂ 2016.09.28 දින සිට [illegible] ඇති 3238 දරන [illegible] පැමිණිලිකරුට [illegible] පිස්කල් [illegible] විකිණීම සඳහා.

වර්ෂ 2021 ක් වූ නොවැම්බර් මස 30 වන දින පෙ.ව 11.00 එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, [illegible] කෝරළේ, අංක 129 ඹී දරන මොණරාගල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ [illegible] ලද අංක 1103 සහ වර්ෂ 1998/01/30 වන දින දරන පිඹුරේ නිරූපිත ලොට් 7 දරන බිම් කොටස සඳහා මායිම.
උතුරට : ලොට් අංක 8 සහ ලොට් අංක 02ද [illegible] : ලොට් අංක 06ද
දකුණට : [illegible] අයිති ඉඩමද
බස්නාහිරට : [illegible] අයිති ඉඩමද
යන මායිම් තුළ වූ පර්චස් [illegible] (අ. 0 රූ.0 පර්. 20) [illegible] ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද සමඟ වේ. මෙය මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ [illegible] A 13/29 හි ලියාපදිංචි වී ඇත.

දේපළට ප්‍රවේශ මාර්ගය : මොණරාගල [illegible] 500ක් [illegible] 350ක් [illegible] "T" [illegible] 150ක් [illegible] 10ක් [illegible] 60ක් [illegible] දේපළ පිහිටා ඇත.

ගෙවීම් ක්‍රමය : වෙන්දේසිය අවසානයේදී [illegible] පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.
(1) [illegible] 25% (2) [illegible] 1% (3) [illegible] (4) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ [illegible] 75%ක් [illegible] දින සිට දින 30ක් ඇතුළත මොණරාගල දිසා අධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතුය. [illegible] දේපළ [illegible] ඇත. [illegible] විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.
ප්‍රධාන කළමනාකරු - නීති - සෙලාන් බැන්ක් පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. 011 2436485, 011 2436479
වර්ෂ 2021ක් වූ ඔක්තෝබර් මස 15 වන දින දීය.

සී.ඩබ්ලිව්. දයාරත්න
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්
දිසා අධිකරණය, මොණරාගල.

රන් පැහැ කුඩා බුදු පිළිමයක් තබාගත් සැකකරු රිමාන්ඩ්

● ඇල්ල - ප්‍රසාද් රුක්මල්

පෞරාණික වටිනාකමින් යුතු බවට සැක කරන රන්පැහැති කුඩා බුදු පිළිමයක් සන්තකයේ තිබී අත්අඩංගුවට ගත් සැකකරුවෙකු ලබන 11 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස බණ්ඩාරවෙල වැඩ බලන මහේස්ත්‍රාත් අමිල රණතුංග මහතා ඊයේ (04දා) නියෝග කළේය.

මෙලෙස රක්ෂිත බන්ධනාගාරගත කර ඇත්තේ, පූනාගල, උඩහේන ප්‍රදේශයේ පදිංචි 38 හැවිරිදි පුද්ගලයෙකි.

පූනාගල, අම්පිටිකන්ද ප්‍රදේශයේදී පෙරේදා (03දා) කොස්ලන්ද පොලිස් ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක රත්නසිරි බණ්ඩාර මහතා ඇතුළු නිලධාරීන් පිරිසක් සැකකරු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබිණි.

මෙම රන් පැහැති කුඩා බුදුපිළිමය ග්‍රෑම් 368ක් බරැති වන අතර, අඟල් පහමාරක් උස හා සෙන්ටිමීටර හතරහමාරක් පළල වන බව පොලීසිය පවසීය.

මෙය පෞරාණික වටිනාකමින් යුතු බුදු පිළිමයක් බවට සැක කරන බවත්, මේ සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව දැනුවත් කර වාර්තාවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත් පොලීසිය ප්‍රකාශ කළේය.

සැකකරු මෙම කුඩා බුදු පිළිමය කිසියම් විහාරස්ථානයකින් සොරකම් කරන්නට ඇතැයි පොලීසිය සැක කරයි.

සිද්ධිය සම්බන්ධයෙන් බදුල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති පී.කේ.ජේ. අපොන්සු, බණ්ඩාරවෙල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අතුල ද සිල්වා යන මහත්වරුන්ගේ උපදෙස් මත කොස්ලන්ද පොලිස් ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක රත්නසිරි බණ්ඩාර මහතා ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

සංවර්ධන නිලධාරීන් 08වැනිදා අසනීප වෙනවාලු

● ඉන්දික සේවාවිතාරණ

රාජ්‍ය සේවාව හා පළාත් රාජ්‍ය සේවාව යටතේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් හා අභ්‍යාසලාභී උපාධිධාරීන්ගේ ගැටලු විසඳීම දිගින් දිගටම ප්‍රමාද කරන නිසා එයට විරෝධය පා මේ මස 08වැනිදා දීපව්‍යාප්ත අසනීප නිවාඩු වාර්තා කිරීමේ එක්දින වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් ගන්නා බව සංවර්ධන නිලධාරී සේවා සංගමය සඳහන් කරයි.

මූලික ගැටලු 07ක් මුල් කර ගනිමින් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ හා ආශ්‍රිත සේවාවට අයත් උපාධිධාරීන් ඇතුළු සංවර්ධන නිලධාරීන් එක් ලක්ෂය පනස් දහසකට ආසන්න පිරිසක් මෙම ක්‍රියාමාර්ගයට සම්බන්ධ වන බවද එම සංගමයේ ලේකම් චන්දන සූරියආරච්චි මහතා පැවසීය.

පවතින ගැටලු විසඳන ලෙස ඉල්ලා රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයාගෙන් හා පළාත් ආණ්ඩුකාරවරුන්ගෙන් පසුගිය 25වැනිදාත් ලිඛිතව ඉල්ලා සිටි බවත්, එහෙත් පවතින ගැටලු පිළිබඳ සාකච්ඡාවක් හෝ ලබාදීමට බලධාරීන් කටයුතු නොකළ බවත් හෙතෙම පවසා සිටියේය.

මේ අනුව 06/2006 චක්‍රලේඛය මඟින් ඇති කළ වැටුප් විෂමතාව නිවැරදි කර උපාධිධාරී මූලික වැටුප ඉහළ දැමීම, උපාධිධාරීන් හරහා කාර්යාලු සේවාවන් පමණක් පවත්වාගෙන යාම වෙනුවට උපාධියට සාධාරණ හා පිළිගත හැකි රාජකාරි ක්‍රමවේදයක් සකස් කිරීම, 2016 සිට රාජ්‍ය සේවකයන්ට අහිමි කර ඇති විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීම, අභ්‍යාසලාභී පුහුණු කාලය ස්ථිර සේවා කාලයට එකතු කිරීම, ගමන් වියදම් දීමනා ඉහළ දැමීම, සියලුම අභ්‍යාසලාභීන් කල් නොමරා සඩහමින් ස්ථිර කිරීම යන ඉල්ලීම් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා මෙම ක්‍රියාමාර්ගය ගන්නා බවද ලේකම්වරයා පැවසීය.

විශේෂ 06/2006 වැටුප් චක්‍රලේඛය ඇති කිරීමත් සමග උපාධිධාරීන් බඳවා ගැනීමේ පැවති මූලික වැටුප හා පරිපාලන සේවයේ මූලික වැටුප අතර පැවති වැටුප් වර්ධක 02ක අගය වැටුප් වර්ධක 14 දක්වා ඉහළ දමා ඇති අතර MN-04 ආශ්‍රිත සේවා උපාධිධාරීන්ට බරපතළ වැටුප් විෂමතාවක් ඇති කරන ලදි. වැටුප් කොමිසමටත් අවසන් වරට පත් කළ රනුක්ගේ වැටුප් කමිටුව දක්වා ගැටලු ඉදිරිපත් කර ඇතත්, මේ දක්වා ඊට විසඳුම් ලැබී නොමැති බවද ඒ මහතා සඳහන් කළේය.

සංවර්ධන නිලධාරියෙකු ලෙස සේවයට එකතු වෙන උපාධිධාරීන් වසර 30ක්, 35ක් සේවා කාලයක් නිම වී විශ්‍රාම යාමට නියමිතව ඇත්තේ, සංවර්ධන නිලධාරී තනතුරෙන්ම බවත්, සේවා කාලය තුළ කිසිදු තනතුරු උසස්වීම් පටිපාටියක් ලබාදී නොමැති බවත් ලේකම්වරයා පවසා සිටියේය.

'Flash' ඇප් සේවාව, ගෝලීය Doconomy සමග ඒකාබද්ධ වෙයි

කොමර්ෂල් බැංකුව විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන බැංකුව විසින් සංවර්ධනය කළ 'Flash' ඩිජිටල් බැංකුකරණ ඇප් පහසුකමේ තිබෙන පරිසරයට මුදාහරින කාබන් ප්‍රමාණය ගණනය කිරීමේ කැල්කියුලේටරයේ ඵලදායීතාවය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික විසඳුම් සම්පාදනයේ ගෝලීය ප්‍රමුඛයෙකු වන ස්වීඩනයේ Doconomy සමාගම සමග බැංකුව ඒකාබද්ධ වී තිබේ.

ලෝකයේ පළමු B-mrsir බලපෑම් වාර්තාව මුලින්ම සංවර්ධනය කළ ෆින්ලන්තයේ Aland බැංකුවේ Aland දර්ශකය දැන් Doconomy සමාගමට අයත් වේ. Aland දර්ශකයේ පළමුවන සංස්කරණය මඟින් Flash ඩිජිටල් ඇප් පහසුකමේ තිබෙන 'Save the Environment' අංගයට සවිබලය ලබාදෙන අතර බැංකුව සඳහන් කරන්නේ මෙම දර්ශකයේ නව අයිතිකරුවන් සමග ඇතිකර ගත් ඒකාබද්ධතාවය මඟින් Flash ඩිජිටල් ඇප් පහසුකම සංවර්ධනය කරගනිමින් එහි විෂය පථය පුළුල් කරගැනීමට අවස්ථාව ලැබී තිබෙන බවයි.

මේ අතරයෙන් Doconomy සමාගම සමග එක්ව මෙම දර්ශකයට ප්‍රවේශවීම මඟින් සිය ගනුදෙනුකරුවන් විසින් පරිසරයට මුදාහරින කාබන් ප්‍රමාණය අඩුකිරීමට කටයුතු කරන ලෝකයේ ප්‍රමුඛතම බැංකු කිහිපයක් අතර කොමර්ෂල් බැංකුව සිටී. මීට අමතරව, යාවත්කාලීන කළ දර්ශකය සමග ඒකාබද්ධවීම තුළින් Flash ඇප් පහසුකම භාවිතා කරන්නන් ගනුදෙනු කරන භාණ්ඩ හා සේවා පරිසරයට මුදා හරින කාබන් ප්‍රමාණය ගණනය කිරීමට අමතරව සමස්ත අගය දාමය විසින් පරිසරයට මුදාහරින කාබන් ප්‍රමාණය ගණනය කළ හැකිවේ.

රත්නපුර දිස්ත්‍රික් ග්‍රාමීය ජනතාවට එයාර්ටෙල් 4G තාක්ෂණය

ගමට සන්නිවේදනය ව්‍යාප
PRO
A DIGIT

එයාර්ටෙල් ලංකා සමාගම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසන් සභාව (TRCSL) සමග එක්ව දිවයින පුරා පවතින ආවරණ ජාලයේ බාධාවන් මඟහරවා ගැනීම සඳහා දියත් කරන ලද 'ගමට සන්නිවේදනය' වැඩසටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉදිකළ නව 4G සන්නිවේදන කුලුනේ වැඩකටයුතු අවසන් කළ බව නිවේදනය කළේය.

මෙම වැඩසටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ උඩපිටිය ප්‍රදේශයේ අලුතින් ඉදි කළ 4G කුලුන මඟින් වර්ග කිලෝමීටර් 91 ක ප්‍රදේශයක් ආවරණය කරන අතර එම ප්‍රදේශයේ ජීවත් වන 12,219 ක ජනතාවට අතියයින් වැඩිදියුණු කළ එයාර්ටෙල් ජාල ආවරණ පහසුකම් සලසයි. දුෂ්කර ග්‍රාමීය ප්‍රජාවන් ඩිජිටල්කරණයෙන් සවිබල ගැන්වීම මඟින් සෑම පුද්ගලයෙකුම ඔවුන්ගේ දෛනික වැඩ කටයුතු සමග සම්බන්ධ කරමින් වඩාත් ඵලදායීව ජීවා සිදු කරගැනීමට සහ බාධාවකින් තොර අඛණ්ඩ දුරස්ථ ඉගෙනුම් හා හමුවලීය සේවා අවශ්‍යතා සඳහා සහාය වීම අරමුණු කරයි.

මේ පිළිබඳව අදහස් දක්වන එයාර්ටෙල් ලංකා ප්‍රධාන විධායක නිලධාරී/කළමනාකාර අධ්‍යක්ෂ අශීෂ් චන්ද්‍රා මහතා "රත්නපුරයේ සන්නිවේදන කුළුන ස්ථාපිත කිරීමත් සමඟින් උඩපිටිය ප්‍රදේශයේ ජනතාවට දැන් අපගේ ජාත්‍යන්තර මට්ටමේ, buffer free 4G ජාලයට පහසුවෙන් ප්‍රවේශ වීමට හැකියි.

"Micro MG 'කප්'"ආසන හතේ SUV මෝටර් රථය

ලෝකයේ කාර්මික නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඉතාමත් සුවිශේෂී ස්ථානයක් හිමිකරගෙන ඇත්තේ මෝටර් රථ නිෂ්පාදනය, එකලස් කිරීම සහ අමතර කොටස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයයි. දිනෙන් දින යාවත්කාලීන වන තාක්ෂණය හේතුවෙන් මෙම ක්ෂේත්‍රයේ හිරන රටවල් අතර මෙන්ම නිෂ්පාදන ආයතන අතරද ඇත්තේ එකිනෙකා පරයා යන තරඟකාරී ස්වභාවයකි. සෑම රටක්ම, සෑම නිෂ්පාදන ආයතනයක්ම සිය පාරිභෝගිකයනට උපරිම තෘප්තියක් ලබා දෙන මෝටර් රථය ලබා දීමට පෙළඹීම තුළින්, ස්වයං ධාවක මෝටර් රථ පවා නිර්මාණය කිරීමට තරම් මෙම ක්ෂේත්‍රය දියුණු මට්ටමකට පත් වී ඇත.

වර්තමාන රජයේ දේශීය කර්මාන්ත නංවාලීමේ ප්‍රතිපත්ති පුනාගය යථාර්ථයක් බවට පත් කිරීමේ ජාතික මෙහෙවරේ පුරෝගාමියෙකු වූ කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මැතිතුමාගේ ඉමහත් කැපවීම මත, ශ්‍රී ලංකාවේ මෝටර් රථ දේශීයව එකලස් කිරීමේ කර්මාන්තය වෙත අවධානය යොමු කරමින්, වසර පහක් වැනි දීර්ඝ කාලයක් තිස්සේ ඉටු කර ගැනීමට නොහැකි වූ මෝටර් රථ එකලස් කිරීමේ හා නිෂ්පාදනය කිරීමේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සලසන "සම්මිත මෙහෙයුම් පටිපාටිය" ට කැබිනට් අනුමැතිය ලබා ගෙන එය ශ්‍රී ලංකා ගැසට් පත්‍රයක් ලෙස නිකුත් වීම ශ්‍රී ලාංකිකයන් ලද ජයග්‍රහණයකි. එමඟින් මේ වන විට දෙස් විදෙස් ආයෝජකයන්ට එම කර්මාන්ත ක්ෂේත්‍රයේ විශ්වාසයෙන් යුතුව ආයෝජනය කළ හැකි නිශ්චිත රාජ්‍ය ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කර දෙනු ලැබ තිබේ.

HNB ජාත්‍යන්තර මූල්‍ය සඟරා සම්මාන උළෙලේදී සම්මාන හිමි කර ගනී

ශ්‍රී ලංකාවේ නවෝත්පාදන පාරිභෝගික බැංකුව වන හැටන් නැෂනල් බැංකුවල 2021 ජාත්‍යන්තර මූල්‍ය සඟරා සම්මාන උළෙලේදී බැංකුකරණ අංශයේ "විශිෂ්ටතම පාරිභෝගික බැංකුව" සහ "විශිෂ්ටතම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) බැංකුව" යන සම්මාන හිමිකර ගනිමින් සිය විශිෂ්ටත්වය නැවත වරක් තහවුරු කර ඇත.

ලෝකයේ වඩාත්ම සාර්ථක මූල්‍ය ආයතන ඇගයීමට ලක් කිරීම හා සැමරීම සඳහා ගෝලීය වේදිකාවක් ලෙස සැලකෙන කීර්තිමත් ජාත්‍යන්තර මූල්‍ය සඟරාව විසින් සංවිධානය කරන ලද මෙම සම්මාන උළෙල නවෝත්පාදන, යටිතල පහසුකම් සංවර්ධනය සහ පාරිභෝගික කේන්ද්‍රීයත්වය වෙනුවෙන් ප්‍රමුඛ සමාගම්වල ජයග්‍රහණ සම්මානයට පාත්‍ර කරයි.

රෙගුලාසි, තාක්ෂණික සංවර්ධනයන් සහ වෙළෙඳපළ ප්‍රතිසංස්කරණ රාශියක් හේතුවෙන් බැංකු ක්ෂේත්‍රය ක්‍රමයෙන් වෙනස් වී ඇති බැවින්, සෑම අයදුම්කරුවෙකුගේම ඉදිරිපත් කිරීම, කාර්යසාධනය සහ අතීත ජයග්‍රහණ කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වමින් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විසින් ඔවුන්ව විනිශ්චයට ලක් කළේය.

සංජේ විජේමාන්න, HNB [illegible]

"කීර්තිමත් ජාත්‍යන්තර මූල්‍ය සඟරාව විසින් විශිෂ්ටතම පාරිභෝගික බැංකුව සහ විශිෂ්ටතම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකුව ලෙස HNB නැවත වරක් ඇගයීමට ලක් කිරීම ගැන අප ඉතා සතුටු වෙනවා. මෙම ඇගයීම SME සහ පාරිභෝගික අංශයේ සිටින අපගේ සේවකයින්ගේ වෙහෙස මහන්සි වී කටයුතු කිරීම හා කැපවීමේ සාක්ෂියක් ලෙස පෙන්වා දිය හැකියි.

අද Business
දැන්වීම් අංශය

කොත්මලේ වෙතින් පළමුවරට යෝගට් සඳහා කඩදාසි හැඳි

ශ්‍රී ලංකාවේ විශාලතම පුද්ගලික අංශයේ හැවුම් කිරි විසකුකරන්නාවන කොත්මලේ සිය යෝගට් සමග එන ප්ලාස්ටික් හැන්ද වෙනුවට කඩදාසි හැන්දක් හඳුන්වා දී තිබේ. මෙය ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන අංශයේ ප්‍රථම වතාවට සිදුවූ හඳුන්වාදීමකි. මෙම හැඳි ඉක්මනින් දිරාපත්වන අමුද්‍රව්‍ය (Biodegradable Material) වලින් සාදා ඇති අතර මේ හරහා නිෂ්පාදන ක්‍රියාවලියේදී ප්ලාස්ටික් භාවිතය විශාල වශයෙන් අඩු කෙරේ. මෙය තිරසර පරිසර සංරක්ෂණය උදෙසා දරන ව්‍යායාමයේ දී කොත්මලේ ගත් තවත් වැදගත් පියවරකි.

පසුගිය වසර කිහිපය තුළ ව්‍යාපාර සහ කර්මාන්තශාලාවල ප්ලාස්ටික් නිෂ්පාදනය හා භාවිතය ඉහළ ගොස් ඇති හෙයින් ඉවතලන ප්ලාස්ටික් ශ්‍රී ලංකාවේ වඩාත්ම දැවෙන පාරිසරික ප්‍රශ්නවලින් එකක් බවට පත්ව ඇත. පාරිභෝගිකයින්ගේ කෝණයෙන් බලනවිට ප්ලාස්ටික් කල්පවතින, සැහැල්ලු සහ බහුකාර්ය ද්‍රව්‍යයකි. කෙසේ වෙතත්, එහි අවාසිය වන්නේ ප්ලාස්ටික් සම්පූර්ණයෙන්ම දිරාපත්වීමට වසර 400 කට වඩා වැඩිකාලයක් ගතවීමයි. භාවිතය අවම කිරීමට සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඉවත්කිරීම වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට පියවර නොගතහොත් මෙය පරිසරයට සැලකියයුතු බලපෑමක් ඇතිකරයි. මෙම තත්ත්වය හඳුනාගනිමින් සහ තිරසාරත්වය සම්බන්ධයෙන් නාගිල්ස් සමූහයේ කැපවීමට අනුගත වෙමින් කොත්මලේ සිය මෙහෙයුම් සහ ක්‍රියාවලියන් නවීකරණය කරනු ලැබුවේ ප්ලාස්ටික්වලින් තොර හෝ අවම භාවිතයක් සහිත මූලාරම්භයන් හරහා ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලියට තිරසාරකත්වය එක්කර ගනිමිනි.

SAMSUNG "Galaxy for the Planet" හඳුන්වා දෙයි

Galaxy for the Planet

ශ්‍රී ලංකාවේ අංක 1 smartphone සැපයුම්කරු වන සැම්සුන් මෑතකදී Galaxy for the Planet වැඩසටහන එළිදැක්විය. ප්‍රමාණය, නවෝත්පාදනයන් සහ විවෘත සහයෝගීතාවයේ ස්වභාවය අනුව බලගැන්වුනු සැම්සුන් හි ජංගම සන්නිවේදන ව්‍යාපාරය සඳහා වූ තිරසාර වැඩසටහන වන්නේ Galaxy for the Planet ය. මේ හරහා දේශගුණික අර්බුද සඳහා නිශ්චිත පිළියම් යෙදීමට හැකි විමද විශේෂත්වයකි.

2025 වන විට සමාගමෙන් සිදුවන පරිසර දූෂණය අවම කිරීම සහ නිෂ්පාදන ක්‍රියාවලියේ සිට Galaxy නිෂ්පාදන බැහැර කිරීම දක්වා වූ සම්පත් ක්ෂය වීම අවම කිරීම සඳහා සාක්ෂාත් කරගත යුතු මූලික ඉලක්ක ස්ථාපිත කර තිබේ.

"අනාගත පරම්පරාව වෙනුවෙන් අපගේ ලෝකය ආරක්ෂා කිරීමට නවා විසඳුම් ලබා දීමේදී සෑම කෙනෙකුටම ඉහළ කාර්යභාරයක් පැවරී ඇතැයි අපි විශ්වාස කරනවා. ලොව පුරා ඇති අපගේ සමස්ත Galaxy ecosystem හි පරිමාණයට, අපගේ ආගාශයට හා විශාලත්වයට සරිලන ලෙස අපගේ ප්‍රයත්නයන් ගැලපිය යුතු බවට සැම්සුන් අවබෝධ කරගෙන සිටිනවා." Galaxy for the Planet වඩාත් තිරසාර ලෝකයක් නිර්මාණය කිරීමේ අපගේ ගමනේ වැදගත් පියවරක් වන අතර, අප කරන සෑම දෙයක් සඳහා අපව මෙහෙය වනු ලබන විවෘතභාවය (openness), විනිවිදභාවය සහ සහයෝගීතාවය සමඟ අප එසේ කරන්නෙමු." යනුවෙන් සැම්සුන් ශ්‍රී ලංකා හි කළමනාකාර අධ්‍යක්ෂ සෙවින් සුන්ග්ලු යු පැවසුවේය.

සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන කළ පිරිස් අසරණ වෙලා

සිමෙන්ති මිල ඉහළ යෑම හා හිඟය ප්‍රධාන ගැටලුවක්

● ඉන්දික සේවාවිතාරණ

සිමෙන්ති හිඟය නිසා හා සිමෙන්ති මිල දිනෙන් දිනම ඉහළ යාම නිසා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිරත පිරිස හා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන කටයුතු කළ පිරිස් දැඩි අසරණ තත්ත්වයකට පත්ව සිටින බව සමස්ත ලංකා කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ සංගමය සඳහන් කරයි.

මේ නිසා පෙදරේරුවන්ට හා සහායකයන්ටත් රැකියා අහිමි වී ගොස් තිබෙන බවත්, මෙම තත්ත්වය දිගටම පැවතියහොත් දේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රය හා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය සම්පූර්ණයෙන් කඩා වැටී ලක්ෂ ගණනකට රැකියා අහිමි වන බවත් එම සංගමයේ සභාපති නන්ද හිරුණ කුමාර මහතා පැවසීය.

මේ වනවිට සිමෙන්ති කොට්ටයක මිල රුපියල් එක්දහස් හයසිය දක්වා ඉහළ ගොස් තිබෙන බවත්, සමහර ප්‍රදේශවල එම මිලටවත් සිමෙන්ති මිලදී ගැනීමට නොමැති බවත් ඒ මහතා පවසා සිටියේය.

මීට අමතරව සිමෙන්ති අලෙවි කරන පිරිස් සිමෙන්ති මිලදී ගැනීමේදී යකඩ, වැලි හෝ ගල් ඇතුළු වෙනත් ද්‍රව්‍ය මිලදීගත යුතු බව බොහෝ ව්‍යාපාරිකයන් හිමි පැනවීම නිසාත් ජනතාව අසරණ තත්ත්වයකට පත්ව සිටින බවද සභාපතිවරයා සඳහන් කළේය.

පොහොර ගැටලු ඇතුළු විවිධ ගැටලු මුල් කර ගනිමින් ආර්ථික දුෂ්කරතා සහිත ග්‍රාමීය ජනතාව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සහායකයන් ලෙස පසුගිය කාලයේ කොළඹ හා තදාසන්න ප්‍රදේශවලට පැමිණි බවත්, සිමෙන්ති නොමැති නිසා ඉදිකිරීම් කටයුතු සිදුවන බොහෝ ස්ථාන වසා දමා හෝ වැඩ කටයුතු සීමා කිරීම නිසා යළිත් වතාවක් එම ජනතාව අසරණ වී සිටින බවත් ඒ මහතා පවසා සිටියේය.

හාරගත් වැඩ කොටස් නියමිත වේලාවට ලබා නොදීම නිසා කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් මුදලින් යම් කොටසක ප්‍රමාද ගාස්තු වශයෙන් ගෙවීමට පවා සිදුවන අවස්ථා තිබෙන බවද සභාපතිවරයා ප්‍රකාශ කළේය.

මීට අමතරව මීට මාසයකට පමණ පෙර සිමෙන්ති කොට්ටයක මිල රුපියල් දහසක් යන පදනමින් කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කළ පිරිස්වලට සිමෙන්ති කොට්ටයක් රුපියල් එක්දහස් පනසියයට වැඩි මුදලකට මිලදී ගැනීමට සිදුවීම නිසාත් විශාල පාඩුවක් සිදුවන බවද හෙතෙම පවසා සිටියේය.